*සැ. යු. :- මෙම අති විශේෂ ගැසට් පත්‍රයෙහි දෙමළ හා ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළවේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2102/40 - 2018 දෙසැම්බර් මස 21 වැනි සිකුරාදා - 2018.12.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උප වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, දෙදහස් දහ අටේ සැප්තැම්බර් මස විසි හත් වෙනි දින සිට බලාත්මක වන පරිදි කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතය සංශෝධනය කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනතේ අරමුණු සඳහා මේ සමග පළ කරමි. මෙම සංශෝධන දෙදහස් දහ අටේ සැප්තැම්බර් මස විසි හත් වෙනි දින සිට බලාත්මක වේ. ඊට කලින් ව්‍යවහාරකරණය සඳහා අවසර දේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

ප්‍රසන්න ලියනගේ,
ලේකම්.

2018 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 A,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දීය.

## කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය සඳහා වූ සංශෝධන

| | |
|---|---|
| 1.1අ | ඡේදය අළුතින් එකතුකර ඇති අතර 1.1 ඡේදය සංශෝධනය කර ඇත. අළුත් පාඨ යටින් ඉරි ඇඳ ඇති අතර ඉවත් කළ ඡේද කපා ඉවත් කර ඇත. |

## 01 කොටස

## *කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන්*

## මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි (SLFRS) අපේක්ෂිත විෂය පථය

1.1 කුඩා හා මධ්‍යම පරිමාණික අස්තිත්වයන් සඳහා වූ මෙම (SLFRS) ගිණුම්කරණ ප්‍රමිත **කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන්හි** භාවිතය සඳහා වූවකි. කුඩා හා මධ්‍යම පරිමාණික අස්තිත්වයන්හි ගති ලක්ෂණ මෙම කොටසෙන් විස්තර කෙරේ.

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ 5 වන කොටස යටතේ වර්ග කරන ලද පහත සඳහන් සමාගම් මෙම ප්‍රමිතිය අනුව කුඩා හා මධ්‍යය පරිමාණ නිර්වචනයට අයත් නොවේ.

…

- මෙම ප්‍රමිතයේ 1.1අ ඡේදයේ විධිවිධාන වලට යටත්ව එම්පවර් පුවරුවෙහි ලැයිස්තු ගත කරන ලද සමාගම් හැර, 1987 අංක 36 දරන සුරකුම්පත් හා විනිමය කොමිෂම යටතේ කොටස් හුවමාරුවක ලැයිස්තු ගත කරන ලද සමාගම්.

1.1අ 1987 අංක 36 දරණ සුරකුම්පත් හා විනිමය කොමිෂම යටතේ එම්පවර් පුවරුවෙහි ලැයිස්තු ගත කරන ලද සමාගම්වලට, එකී පුවරුවෙහි ලැයිස්තු ගත කිරීමෙන් පසුව අනුයාත වර්ෂ තුනක කාලයකට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා, පහත සඳහන් අමතර හෙළිදරව් කිරීම් සහිතව කුඩා හා මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ව්‍යවහාර කර ගනු ලැබිය හැක.

- 2018 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා SLFRS 15 ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින් වන අයභාරය ප්‍රමිතය ව්‍යවහාර කරනු ලැබුවේ නම් විස්තීර්ණ අදායම් ප්‍රකාශයට වන බලපෑම පිළිබඳව වන හෙළිදරව්කිරීම්. එම බලපෑම නිශ්චය කිරීම ප්‍රායෝගික නොවන්නේනම්, ඒ බව හෙළිදරව් කළ යුතුය.

- සමාගම සතුව සංකීර්ණ මූල්‍ය සාධන පත්‍ර වේනම් SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර ප්‍රමිතය අනුව වන හෙළිදරව් කිරීම්.

- SLFRS 13 අනුව සමාගමේ වත්කම් හා වගකීම් අගය කිරීම සඳහා සාධාරණ අගයමත වන මිනුම් භාවිතා කරන්නේනම් SLFRS 13 සාධාරණ අගය මැනීම ප්‍රමිතය අනුව වන හෙළිදරව් කිරීම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.